# කොළඹ වැසියන් සම්ප්‍රදායික ජීවිතවලට කොටු නොකර විශ්වාසය ඇති කර හදවත් දිනාගත යුතුයි

## කොළඹ නගරාධිපති අපේක්ෂක මිලින්ද මොරගොඩ

**කොළඹ නගරයේ ජීවත් වන වැසියන් තුළ හිතිය ඇති කර ඔවුන් සම්ප්‍රදායික ජීවිතවලට කොටු කිරීම වෙනුවට ඔවුන්ගේ හදවත් දිනාගෙන විශ්වාසයක් ඇති කළ යුතු අතර අනාගතය ගොඩනැඟිය හැකි නව වැඩපිළිවෙළක් වෙනුවෙන් මහජනතාවගේ සම්පූර්ණ එකඟතාව වැදගත් බව එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ නගරාධිපති ධුරාපේක්‍ෂක මිලින්ද මොරගොඩ මහතා පැවසීය.**

උතුරු කොළඹ ප්‍රදේශයේ පැවැති සංවාදශීලී ජනහමුවකට සහභාගි වෙමින් මොරගොඩ මහතා එසේ කීය. මෝදර අලුත් මාවත පාරේ සිය කොට්ඨාස දේශපාලන කාර්යාලයද මෙහි දී විවෘත කරන ලදී.

**මොරගොඩ මහතා මෙසේ ද පැවසීය.**

කොළඹ නගරය දියුණු කළ යුතුයි. පසුගිය ගැටුම් සහිත පරිසරය තුළ නගරයේ සංවර්ධනය අවධානයට ලක්වුණේ නැහැ. ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් අනතුරුව සමාජයේ දැවෙන ප්‍රශ්න ගැන සිතන්නට අපට අවස්ථාව ලැබී තිබෙනවා. අද කොළඹ නගරය තුළ වෙසෙන මහජනතාව අතර අනියත බියක් පතුරවමින් සිටිනවා. මේ මතය කියන්නේ ජනතාව නගරයෙන් ඉවත්කරන බවයි ලෝකයේ කොහේවත් මහජනතාව නැතිව සංවර්ධනයක් නැහැ. ආර්ථිකයකට මහජනතාව අවශ්‍යයි. වරායට හෝටලයට රෝහලට එහෙම නැතිනම් කර්මාන්ත ශාලාවට සේවය ලබා ගන්න එන පිරිස වගේම සේවය සලසන්නටත් කණ්ඩායමක් අවශ්‍යයි.

මේ පිරිස කොළඹින් පිට ප්‍රදේශයක පදිංචි කරලා අවශ්‍ය සේවය සලසන්න බැහැ. අද අපට දකින්න අහන්න ලැබෙන්නේ බිය ඇතිකරලා කරන දේශපාලනයක්. එය ප්‍රජාතන්ත්‍රවාදය නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ අදහස් ඉදිරිපත් කර මහජන සම්මුතියෙන් පාලනය කිරීමයි. ඒක මහජනතාවගේ කැමැත්ත. මහජනතාවට බිය ඇති කර පාලන බලය ලබා ගැනීමට වඩා මහජනතාව සමඟ සාකච්ඡාකර ඔවුන්ගේ අවශ්‍යතා හඳුනාගෙන ඒවා ඉටු කිරීම මහජන නියෝජිතයන්ගේ වගකීම බවට



පත්විය යුතුයි. මම ඒ වගකීම ඉටු කරන්නට සූදානම්. ඒ වෙනුවෙන් සකස්කරන ලද කොළඹ නගරය පරමාදර්ශී නගරයක් කිරීමේ ප්‍රතිපත්ති කතිකාව මම ඔබ හමුවට ඉදිරිපත් කර තිබෙනවා. එය සම්ප්‍රදායික දේශපාලනයට වෙනස් අත්දැකීමක් වේවි. ඉක්මනින් ඉටු කළ යුතු සේවාව වෙනුවෙන් දවස් සියයක් සම්පූර්ණ කරන වැඩ පිළිවෙළක් වගේ ම මෙම ප්‍රතිපත්ති කතිකාව සාකච්ඡා කරලා එකඟ වෙලා අපි අලුත් වැඩ පිළිවෙළක් හදමු.

අවුරුදු හැට හැත්තෑවක් එකම ආකාරයට ජීවත් වූ ජනතාව මේ සම්ප්‍රදායික ජීවිතවලින් ඇත්කර අලුත් ජීවිතයක් දිය යුතුයි. ඒක දියුණුව. හැමදාම වත්තක ඉන්න පුළුවන්ද? තමන්ට කියා ජීවිතයක් තමන්ගේ දරුවන්ට අනාගතයක් ගොඩනගන්නට අපි සැලසුම් සකස් කර අවසානයි.

භීතියෙන් ප්‍රචණ්ඩත්වයෙන් ඡන්දය දිනාගෙන එයින් බලය අල්ලා ගන්නා යුගය අවසන් කළ යුතුයි. බලය ඇත්තේ මහජනතාවගේ අතේ. ඔවුන්ගේ බලය ගෞරවාන්විතව ලබා ගත යුතුයි. කොළඹ ජීවත්වන මහජනතාවට භීතිය ඇති කර තව දුරටත් වතු සංස්කෘතියටම කොටු කිරීමේ සියුම් උපාය හඳුනාගෙන එයට විරුද්ධවන්නැයි මම ඉල්ලා සිටින්න කැමැතියි.